පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 290

ආයතනයේ නම :පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලය

ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාර රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තා සම්බන්ධයෙන් නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග ඉදිරිපත් කිරීම

பாராளுமன்றத் தொடர் இலக்கம் : 290

நிறுவனத்தின் பெயர் : பாராளமன்றத்தின் அரசாங்கக்கட்சி முதற்கோலாசான் அலுவலகம்

பாராளுமன்ற நிலையியற் கட்டளை 119(4) இன் பிரகாரம் அரசாங்க கணக்குகள் பற்றிய குழுவினால் பாராளுமன்றத்திடம் சமர்ப்பிக்கப்பட்ட அறிக்கை தொடர்பான அவதானிப்புகளும் முன்னெடுப்புகளும் பற்றிய அறிக்கையிடல்

Parliamentary Series No. : 290

Name of the Institution : Office of the Chief Government Whip of Parliament

Submission of observations and steps taken with regard to the reports presented to the Parliament by the Committee on Public Accounts in terms of the Standing Order No. 119(4)

ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාර රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තා සම්බන්ධ නිරීක්ෂණ හා ගනු ලැබූ පියවර ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 290

ආයතනයේ නම: පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලය

කාරක සභාව විසින් හඳුනාගන්නා ලද අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ආයතන විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය
අභ්‍යන්තර විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. 2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගය භාවිත කිරීමේදී එම මෘදුකාංගයට අදාල පළමුවන මුරපදය ගණකාධිකාරී හෝ ඔහුගේ අවසරය ලත් මාණ්ඩලික නිළධාරියෙකු පමණක් භාවිතා කර නොතිබුණි. 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 3.1 ඡේදය සඳහන් විධිවිධාන ප්‍රකාරව විශේෂිත වියදම් ඒකකය සතු වාහනවල ඉන්ධන දහනයවීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි. මු.රෙ. 134(2) ප්‍රකාරව විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදී පිළියෙල කර නොතිබුණි. විගණන හා කළමනාකරණ කමිටු අවම වශයෙන් රැස්වීම් වාර 2ක් වත් පවත්වා නොතිබුණි.	I. 2021 වර්ෂයේදී අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබූ අතර, 2023 වර්ෂයේදී අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවන ලදී. II. 2021 වර්ෂයේදී ගණකාධිකාරිවරයෙකු පත්කර නොසිටි අතර, කාර්යාලයේ සියලු ගිණුම් කටයුතු මුදල් සහකාරවරයෙකු යටතේ සිදු වූ අතර, වැටුප් සකස් කිරීමේ මෘදුකාංගයට අදාල මුරපදය ඔහු විසින් භාවිතා කරන ලදී. 2022 වර්ෂයේ ගණකාධිකාරිවරයෙකු පත්කිරීමත් සමඟ ගිණුම් අංශයට අදාල සියලු මෘදුකාංගවල මුරපද ගණකාධිකාරීගේ අධීක්ෂණය යටතේ භාවිතා කරනු ලබයි. III. 2021 වර්ෂයේදී කොවිඩ් වසංගතය හේතුවෙන් වාහන භාවිතය ඉතාමත් අඩු මට්ටමක පැවති අතර වාහනවල ඉන්ධන දහන පරීක්ෂාවන් සඳහා අවස්ථාවක් නොතිබුණි. 2022 වර්ෂයේ සිට අඛණ්ඩව ඉන්ධන දහන පරීක්ෂාවන් සිදු කරනු ලබයි. IV. 2021 වර්ෂයේදී අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණු අතර මේ වන විට අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා ඇත.

ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි. ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිළි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි. ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අභිතකර මට්ටමේ විය. සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි. හදුනාගත් තිරසර අරමුණු ඉලක්ක ලභා කර ගැනීම මැන බැලීම සඳහා කාර්ය සාධන ඉලක්ක නියම කර නොතිබුණි. හදුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීමට සඳහා දර්ශක නියම කර නොතිබුණි.	I. පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලය වෙනම වැය ශීර්ෂයක් යටතේ ක්‍රියාත්මක වුවද, මෙම කාර්යාලයේ කටයුතු ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව හා ඒකාබද්ධව සිදු කරනු ලැබේ. මෙම කාර්යාලයෙන් සිදු කරනුයේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගේ කටයුතු සම්බන්ධීකරණය කිරීම වන අතර, එකී සියලුම මන්ත්‍රීවරුන්ගේ තොරතුරු ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වෙබ් අඩවියට ඇතුළත් කර ඇත. එබැවින් වෙනමම වෙබ් අඩවියක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයක් මේ දක්වා පැන නැඟී නොමැති වුවද, ඉදිරියේදී පැන නගින අවශ්‍යතාවයන් මත වෙනමම වෙබ් අඩවියක් පවත්වාගෙන යාම පිළිබඳව අවධානය යොමු කර ඇත. ඉදිරි වර්ෂයේ කාර්ය සාධන ගිවිසුම් සකස් කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. II. 2021 වසරේ මුල් කාර්තු 03 තුළ කොරෝනා වසංගත තත්ත්වය මත ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීමට නොහැකි විය. කෙසේ වුවත් අවසන් කාර්තුවේ සියලුම නිලධාරීන් ආවරණය වන පරිදි නිපුණතා ඉලක්ක සපුරා ගැනීම සඳහා සහ එක් එක් විෂයන්ට අදාළ පුහුණු වැඩමුළු සඳහා දෙවතාවකදී නිලධාරීන් සහභාගී කරවා ඇත. III. 2022 වසරේ සිට සමස්ත කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීමට නිලධාරීන්ට උපදෙස් දී ඇත.

එම්.ඩබ්ලිව්. ජගත් කුමාර
ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක ලේකම්
2024.02. 02